**<u>මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පළාත් අභ්‍යන්තර විගණන නිලධාරී සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2022</u>**

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පළාත් අභ්‍යන්තර විගණන ඒකකයේ අභ්‍යන්තර විගණන නිලධාරී තනතුරේ පවත්නා පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා, මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පළාත් අභ්‍යන්තර විගණන නිලධාරී සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය පැවැත්වීමට, පහත සඳහන් සුදුසුකම් ඇති මධ්‍යම පළාත් සභාවේ සේවයේ නිරත රා.ප.ච 03/2016 අනුව MN-2-2016 හෝ ඊට ඉහළ වැටුප් කේත අංකයක් යටතේ වැටුප් ලබන තනතුරක්/සේවයක් සඳහා බඳවා ගෙන ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. පොදු සුදුසුකම්
   - 1.1 අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
   - 1.2 අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
   - 1.3 සෑම අයදුම්කරුවෙකුම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
   - 1.4 තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
   - 1.5 දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් දඬුවම් නොලැබූ අයකු විය යුතුය.
   - 1.6 රජයේ සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ අසාධු ලේඛනයට නම ඇතුළත් නොවූ අයෙකු විය යුතුය.

2. අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද

   මෙහි දැක්වෙන සියලු සුදුසුකම් **<u>2022.11.28</u>** දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්ව විද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධිය ප්‍රදානය කෙරෙන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පිරිනමනු ලබන උපාධියක් ලබා තිබීම.

හෝ

ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ/ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ගණකාධිකරණය හෝ වාණිජ පිළිබඳ උසස් ඩිප්ලෝමාධාරියෙකු වීම.

හෝ

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මණ්ඩලීය රටක වරලත් ගණකාධිකාරී ආයතනයක ආවසරික හෝ අන්තර් මධ්‍ය පරීක්ෂණය හෝ ඊට වඩා ඉහළ පරීක්ෂණයකින් හෝ සමත් වීම,

සහ

පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි වැටුප් කේත අංක MN-2-2016 හෝ ඊට ඉහළ වැටුප් කේත අංකයක් යටතේ වැටුප් ලබන සේවයක/තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක මට්ටමට වඩා ඉහළ කාර්ය සාධන මට්ටමක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු වීම.

හෝ

II. පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි වැටුප් කේත අංක MN-2-2016 හෝ ඊට ඉහළ වැටුප් කේත අංකයක්

යටතේ වැටුප් ලබන සේවයක/තනතුරක අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක මට්ටමට වඩා ඉහළ කාර්ය සාධන මට්ටමක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු වීම.

3. වැටුප
අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පළාත් අභ්‍යන්තර විගණන නිලධාරී සේවයේ III, II, I වන ශ්‍රේණිවලට අදාළ මාසික වැටුප් පරිමාණය MN 4- 2016 : රු. 31,490 – 10x445 -11 x 660 – 10 x 730 – 5 x 750 – රු. 54,250 ක් වන අතර, එම වැටුප පත්වීම ක්‍රියාත්මක වන දින සිට ගෙවනු ලැබේ.

රු. 35,940 න් ඔබ්බට යාම සඳහා II වන ශ්‍රේණියට උසස් වීම ද, රු. 43,200 න් ඔබ්බට යාම සඳහා I වන ශ්‍රේණියට උසස් වීම ද ලබා ගත යුතුය. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනාද ඔබට හිමිවේ.

4. බඳවා ගැනීමේ කොන්දේසි.
මෙම තනතුරට අදාළව අනුමත කර ඇති බඳවා ගැනීමේ පරිපාටිය අනුව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බඳවා ගැනීමේ කොන්දේසි තීරණය වේ.

5. බඳවා ගැනීමේ ක්‍රමය.
උක්ත අංක 02 යටතේ දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කරන ලද මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීම් දරණ එම පත්වීම්වල සේවය ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව, වැටුප් කේත අංක MN-2-2016 හෝ ඊට ඉහළ වැටුප් කේත අංකයක් යටතේ වැටුප් ලබන නිලධාරින් පමණක් තරග විභාගයට ඇතුළත් කරනු ලැබේ. අපේක්ෂකයන්ට සිය මනාපය පරිදි එක් භාෂා මාධ්‍යයකින් පමණක් මෙම විභාගයට පෙනී සිටිය හැක. විභාගයේ එක් එක් විෂය සාමාර්ථය සඳහා මුළු ලකුණුවලින් අවම වශයෙන් 40% ලබා ගත යුතුය. සීමිත ලිඛිත තරග විභාගයේ ප්‍රතිඵල මත පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකින් අදාළ සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු තනතුරු සංඛ්‍යාවෙන් 50%කට සමාන සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට භාජනය කර බඳවා ගනු ලැබේ.

6. සේවා කොන්දේසි.

6.1. පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම පිරවීමට හෝ නොපිරවීමට මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

6.2. මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලටද, 2022.05.31 දින ගරු මධ්‍යම පළාත් ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද මධ්‍යම පළාත් අභ්‍යන්තර විගණන ඒකකයේ පළාත් අභ්‍යන්තර විගණන නිලධාරි සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලටද, එම පරිපාටියට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධනවලටද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලටද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයෙකු සේවයේ III ශ්‍රේණියට පත්කරනු ලැබේ.

6.3 මෙම විභාගයෙන් සාමාර්ථය ලබන අයැදුම්කරුවන්ට පත්වීමේ දින සිට එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත්ව පත්වීම් දෙනු ලැබේ. ඔවුන්ගේ තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මධ්‍යම පළාත් අභ්‍යන්තර විගණන නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය. සීමිත පදනම යටතේ පත්වීම් ලබන නිලධාරීන් හට මීන් පෙර එම නිලධාරීන් දරණ ලද තනතුර සඳහා අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව ඇත්නම් මෙම පරිපාටියේ සඳහන් පළමු කාර්යක්ෂමතා කඩඉමෙන් සමත් වීමේ අවශ්‍යතාවයෙන් පමණක් නිදහස් කෙරේ.

6.4. අදාළ පත්වීම රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුශාංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධානයන්ට යටත් වේ.

7. අයැදුම් කිරීමේ ක්‍රමය.

විභාග ගාස්තුව රු.600/-කි. මෙම විභාග ගාස්තුව මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැර වන පරිදි මධ්‍යම පළාත තුළ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට අයැදුම්කරුගේ නමින් ගෙවා ඒ සඳහා ලබා ගත් <u>නිල් පැහැති ලදුපත</u> අයැදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. <u>වෙනත් ශීර්ෂයකට ගෙවීම් කරන ලද කුවිතාන්සි හෝ මධ්‍යම රජයට අයත් කහ පැහැති කුවිතාන්සි අලවා ඇතොත්</u> එම අයැදුම්පත ප්‍රතික්ෂේප කරන අතර ගෙවන ලද විභාග ගාස්තුව කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ.

තැපැල් මාර්ගයෙන් අයැදුම්පත් එවීමේ දී ඒ ඒ ආයතනයට දැරීමට සිදුවන ලිපිද්‍රව්‍ය වියදම් හා අධික තැපැල් වියදම් අවම කිරීමේ පියවරක් ලෙස මෙම විභාගයේ අයැදුම්පත් එවීම සඳහා මාර්ග-ගත ක්‍රමවේදයක් ඔස්සේ සිදුකිරීමට නියමිත අතර එය පහත සඳහන් පරිදි වේ.

(i). අයැදුම්පතෙහි ඇතුළත් කළයුතු තොරතුරු ඇතුළත් කිරීම සඳහා ගූගල් පෝර්මයක් (Google Form) සකස් කර එහි දිගුව (Hyperlink) ඔබගේ ආයතනයේ නිල විද්‍යුත් තැපැල වෙත එවනු ලැබේ. **(මෙය ඔබ ආයතනය යටතේ උප ආයතන පවතින්නේනම් ඒවාට හැර වෙනත් බාහිර පාර්ශව වෙත යැවීම නොකළ යුත්තකි)**

(ii). එක් එක් ආයතනය මගින් අයැදුම්කිරීමට බලාපොරොත්තු වන විභාග අපේක්ෂකයින්ගේ තොරතුරු ඒ ඒ ආයතනය මගින් එක්රැස් කර විෂය නිලධාරී (හෝ සුදුසු නිලධරයෙකු) මගින් අදාළ ගූගල් පෝර්මය පුරවා ඉදිරිපත් කළ යුතුය.

(අපේක්ෂකයින්හට තම තොරතුරු අදාළ විෂය භාර නිලධාරී වෙත ලබාදීම සඳහා අයැදුම්පත් කැඳවීමේ දැන්වීම සමගම ඇති ආදර්ශ අයැදුම්පත්‍රය පුරවා ලබාදිය හැකි අතර විෂය නිලධාරී (හෝ සුදුසු නිලධරයෙකු) විසින් එම අයැදුම්පත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය ලබාගෙන එම තොරතුරු නිවැරදිව ගූගල් පෝර්මය වෙත ඇතුළත් කළ යුතුය.)

(iii). මෙහිදී ආයතන ප්‍රධානියා විසින් අදාළ අයැදුම්පත් හි සුදුසුකම්, පෞද්ගලික ලිපිගොනුව අනුව නිරවද්‍යතාවය පරීක්ෂා කර බලා තහවුරු කරගෙන නිර්දේශ කළ යුතුය.

(iv). පෞද්ගලික ලිපිගොනු නඩත්තුව සිදු වන්නේ තමා සේවයේ නියුතු ආයතනයෙන් පරිබාහිර ආයතනයක නම් එම ආයතනය වෙත අයැදුම්පත් යැවිය යුතු අතර එහි අදාළ විෂය නිලධාරියා(හෝ සුදුසු නිලධරයෙකු) වෙත අදාළ ගූගල් පෝර්මය පිරවීමේ වගකීම පැවරේ.

(v). අපේක්ෂකයින් සාමාන්‍ය පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට විභාග ගාස්තු ගෙවා ලබාගන්නා නිල් පැහැ ලදුපත තම අයදුම්පතෙහි අලවා විෂය භාර නිලධාරියා වෙත භාර දිය යුතු අතර විෂය නිලධාරී විසින් ලදුපත පරිලෝකනය (Scan) කිරීමෙන් හෝ පැහැදිලි ඡායාරූපයක් ගැනීමෙන් ලබාගන්නා එහි මෘදු පිටපත ගූගල් පෝර්මය වෙත ඇතුළත් කළ යුතුය. ඒ ආකාරයටම;

a. අයදුම්පත,

b. අයදුම්කරුගේ තනතුරට අදාළ පත්කිරීම් ලිපියෙහි ආයතන ප්‍රධානියා සහතික කරන ලද පිටපතක්,

c. නියමිත අධ්‍යාපන සුදුසුකම් සනාථ කරන සහතිකවල ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද පිටපත්

යන ලේඛන ද පරිලෝකනය කර PDF මාදිලියට හරවා ගූගල් පෝර්මය වෙත ඇතුළත් කළ යුතුය.

(vi). අයදුම්පත ලද බව පෞද්ගලිකව අයදුම්කරුවන් වෙත SMS මගින් හෝ අදාළ ආයතනය වෙත e-mail මගින් දන්වනු ලැබේ.

(vii). විභාග අපේක්ෂකයින් විසින් භාර දෙන ලද අයදුම්පත්වල මුල් පිටපත් ඒ ඒ ආයතනවල පෞද්ගලික ලිපිගොනුවල ගොනු කළ යුතුය.

(viii). තැපැල ඔස්සේ අයදුම්පත් නොඑවිය යුතු අතර අයදුම්පත් භාරගැනීම ගූගල් පෝර්ම හරහා පමණක් සිදුකෙරේ.

(ix). අයදුම්පත් කැඳවීමේ අවසන් දිනයෙන් පසු එම ගූගල් පෝර්මය ඉවත් කරගනු ලැබේ.

සටහන

මෙම නිවේදනය සමඟ අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුව සකස් කරන ලද අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ දැනට දරන තනතුරට අදාළ පත්වීම් ලිපියේ ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද පිටපත හා නියමිත අධ්‍යාපන සුදුසුකම් සනාථ කරන සහතිකවල පිටපත් සමඟ තමා සේවයේ නියුතු ආයතනයේ අදාළ නිලධරයාට භාරදිය යුතු අතර අයදුම්පත් මාර්ගගතව ඇතුළත් කළහැකි අවසන් දිනය 2022.11.28 වන බැවින් අපේක්ෂකයින් විසින් ප්‍රමාණවත් කාලයකට පෙර තම සම්පූර්ණ අයදුම්පත ආයතනය වෙත භාර දිය යුතුය.

8. විභාග මාධ්‍යය

විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. අයදුම්පත්‍රයේ තමන් විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයට නියමිත අක්ෂරය පැහැදිලිව සඳහන් කළ යුතු අතර, එය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. විභාග මධ්‍යස්ථානය.

මෙම විභාගය මහනුවර නගරයේදී පමණක් හෝ අයදුම්කරුවන් සංඛ්‍යාව හා ඔවුන්ගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය අනුව මහනුවර, මාතලේ හා නුවරඑළිය යන නගරයන්හිදී හෝ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි පැවැත්වේ. මේ පිළිබඳව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අයදුම්කරුවන්ට විභාග ප්‍රවේශ පත්‍රය මගින් දැනුම් දෙනු ලැබේ.

10. ලිඛිත විභාගය හා විෂය නිර්දේශය.

අයැදුම්කරුවන් මෙම තනතුරට බඳවා ගැනීම සඳහා පහත සඳහන් විෂය නිර්දේශයන් යටතේ ලිඛිත විභාගයකට යොමු කරනු ලැබේ.

| විෂයන් | විෂය නිර්දේශය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| ආයතන සංග්‍රහය හා කාර්යාල ක්‍රම | රාජ්‍ය සේවයේ විවිධ පරිසරයන්හි ඇතිවිය හැකි ගැටළු එකක් හෝ කිහිපයක් හෝ සම්බන්ධ කරමින් ගොඩනගන ලද සිද්ධියක්/සිද්ධීන් අපේක්ෂකයාට යොමු කර අපේක්ෂකයා සතු නිර්මාණාත්මක චින්තන ශක්තිය හා ගැටළු නිරාකරණය කිරීමේ හැකියාව ආයතන සංග්‍රහයට අදාළ රාජ්‍ය සේවයේ පරිචය මැන බැලීම සහ රජයේ කාර්යාලවල භාවිතා වන කාර්යාල ක්‍රම පිළිබඳව මූලික දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිතා කිරීමේ හැකියාව පරීක්ෂා කෙරේ. | 100 | 40% |
| මුදල් රෙගුලාසි, පළාත් මූල්‍ය රීති හා අභ්‍යන්තර විගණනය පිළිබඳ අවබෝධය | මුදල් රෙගුලාසි පරිච්ඡේද I, II, III, IV, V සහ පළාත් සභා මූල්‍ය රීති පරිච්ඡේද I, II, III, IV, V හා අභ්‍යන්තර විගණන සංකල්ප හා න්‍යාය | 100 | 40% |

11. අයැදුම්පත් පිරවීම සඳහා උපදෙස්. (අයැදුම්කරුවන් සඳහා වැදගත් වේ.)

11.1 ආදර්ශ අයැදුම්පත් ආකෘතිය ප්‍රකාර A 4 ප්‍රමාණයක කඩදාසිය දෙපැත්තම භාවිතා කරමින් එහි පළමු පිටුවෙහි අංක 1-3 දක්වා කරුණු ද අනෙක් පිටුවල ඉතිරි ඡේද ද ඇතුළත්වන සේ සකස් කර ගතයුතුය. අයැදුම්පත්‍රය යතුරු ලියනය කර ගැනීමෙන් හෝ පැහැදිලි අත් අකුරින් සකස් කර ගත යුතුය.

11.2 ඔබ විභාගය සඳහා පෙනී සිටීමට වඩාත් කැමති නගර 02ක් (මහනුවර/මාතලේ/නුවරඑළිය අතුරින්) අනුපිළිවෙළින් සඳහන් කරන්න

11.3 අයැදුම්කරු සම්බන්ධව ආදර්ශ අයැදුම්පත්‍රයේ දැක්වෙන ආකාරයේ නිර්දේශයක් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඉදිරිපත් කළ යුතුය.

11.4 අදාළ සියලුම තොරතුරු සම්පූර්ණ කළ යුතුය

12. ගූගල් පෝර්මය පිරවීම සඳහා උපදෙස්: (විෂය නිලධාරී හෝ සුදුසු නිලධරයා සඳහා වැදගත් වේ.)

12.1 පළමුව තමා වෙත ලැබී ඇති අයැදුම්පත්වල සම්පූර්ණ කළයුතු සියලු තොරතුරු සම්පූර්ණ කර ඇත්දැයි පරීක්ෂා කරන්න. එසේම ඇමුණුම් ලෙස ලබාදිය යුතු පහත සඳහන් ලේඛන සියල්ල තමා වෙත ලබාදී ඇත්ද යන්න පරීක්ෂා කරන්න.

(i). විභාග ගාස්තු ගෙවා ලබාගත් නිල් පැහැ ලදුපත

(ii). තනතුරට අදාළ පත්කිරීම් ලිපියේ ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද පිටපත

(iii). නියමිත අධ්‍යාපන සුදුසුකම් සනාථ කරන සහතිකවල ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද පිටපත්

යම්කිසි අඩුපාඩුවක් ඇත්නම් ගූගල් පෝර්මය පිරවීමට පෙර ඒවා සම්පූර්ණ කරවා ගන්න

12.2 එක් එක් අපේක්ෂකයින්ගේ ඉහත සඳහන් ලේඛන ගූගල් පෝර්මය තුළ උඩුගත (Upload) කිරීමට නියමිත බැවින් වෙන් වෙන් වශයෙන් පරිලෝකනය (Scan) කරගෙන වෙන් වෙන් වශයෙන් PDF මාදිලියට හරවාගන්න.

12.3 ඔබගේ ආයතනයේ නිල විද්‍යුත්-තැපැල වෙත පිවිසෙන්න

12.4 මෙම කොමිෂන් සභාවේ විභාග කටයුතු සඳහා භාවිතා කරන විද්‍යුත් තැපැල් ලිපිනය වන exam.psc.cp.gov@gmail.com මගින් ඔබගේ ආයතනයේ නිල විද්‍යුත් තැපැල වෙත එවා ඇති දිගුව තුළින් ගූගල් පෝර්මය වෙත පිවිසෙන්න

12.5 ගූගල් පෝර්මය පිරවීම සිදුකරන ඔබගේ ආයතනයේ නිල විද්‍යුත් තැපැල් ලිපිනය පළමුව ඇතුළත් කරන්න.

12.6 අයැදුම්පතෙහි ඇතුළත් තොරතුරු ඉතා නිවැරදිව ගූගල් පෝර්මය වෙත ඇතුළත් කරන්න. ඇතුළත් කළයුතු භාෂා මාධ්‍යය විශේෂයෙන් සඳහන් වන අවස්ථාවන්හිදී හැර අන් සියලු තැන්වල සිංහල මාධ්‍යයෙන් සම්පූර්ණ කරන්න.

12.7 තොරතුරු ඇතුළත් කිරීම සඳහා යුනිකේත (Unicode) අක්ෂර පමණක් භාවිතා කළ යුතුය. (Iskoola pota)

12.8 අවසන් කොටස්වලදී අපේක්ෂකයාගේ ලදුපත, පත්කිරීම් ලිපියේ සහතික කළ පිටපත හා අධ්‍යාපන සුදුසුකම් සනාථ කරන ලේඛන නියමිත පරිදි උඩුගත (Upload)කරන්න.

12.9 අවසානයේ දී "Submit" මගින් තොරතුරු ඇතුළත් කිරීම සම්පූර්ණ කරන්න.

13. අයැදුම්කරුවෙකුට බඳවා ගැනීමේ දැන්වීම ප්‍රකාරව සුදුසුකම් නොමැති බව පත්වීම් ලැබීමට පෙර හෝ පත්වීම් ලබා දීමෙන් පසු හෝ ඕනෑම අවස්ථාවකදී අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය හෝ පත්වීම අවලංගු කෙරෙනු ඇත. එසේම දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත්කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත.

14. අයැදුම්කරුවන් තම අයැදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය. අයැදුම්කරු පත්වීම ලැබීම සඳහා තෝරාගනු ලැබී නම් ඔහු/ඇය මුදාහැරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා එකඟ විය යුතුය.

15. අයැදුම්කරුගේ අනන්‍යතාවය -

අයැදුම්කරුවන් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි, ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් පමණක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

i. ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු ශ්‍රීලාංකික රියදුරු බලපත්‍රය

16 මෙම විභාග නිවේදනයට අනුව විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුවද, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේය.

17. මෙහි සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර, කිසියම් අනනුකූලතාවයක් පවතී නම් , එවැනි විටක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කළ යුතුය.

2022 <u>නොවැම්බර් මස 08</u> වෙනි දින,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244, කටුගස්තොට පාර,
මහනුවර.

ටී.ජේ.ඩී.ඩබ්ලිව්. දයානන්ද,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත් සභාව.